සියලු ම හිමිකම් ඇවිරිණි]
All Rights Reserved]

**19302**

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව/Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, අගෝස්තු 1991
General Certificate of Education (Adv. Level) Examination, August 1991

| | |
|---|---|
| **(01) ශුද්ධ ගණිතය II**<br>**(01) PURE MATHEMATICS II** | **01**<br>**S II** |

පැ. තුනයි / *Three hours*

ප්‍රශ්න හයකට පමණක් පිළිතුරු සපයන්න.

---

1. $D, E, F$ යනු $ABC$ ත්‍රිකෝණයෙහි පිළිවෙළින් $BC, CA, AB$ පාද මත පිහිටි ලක්ෂ්‍ය වන විට $AD, BE, CF$ රේඛා ඒකලක්ෂ්‍ය වීම සඳහා අවශ්‍යතාව සඳහන් කර එය සාධනය කරන්න.

ඉහත අවශ්‍යතාව සැපිරේ නම්, $DA$, $EB$ සහ $FC$ ට සමාන්තර ව පිළිවෙළින් $B'C'$, $C'A'$ සහ $A'B'$ ඇඳීමෙන් $A'B'C'$ නම් වෙනත් ත්‍රිකෝණයක් අඳිනු ලැබේ. $BC$ ට සමාන්තරව $A'$ හරහා ඇඳි රේඛාව $X$ හිදී $B'C'$ හමුවන අතර $CA$ ට සමාන්තරව $B'$ හරහා ඇඳි රේඛාව $Y$ හිදී $C'A'$ හමුවේ. $A'X$ සහ $B'Y$ රේඛා $G$ හිදී ඡේදනය වේ. $C'G$ සහ $BA$ සමාන්තර බව පෙන්වන්න.

2. 


$ABCD\,A'B'C'D'$ යනු දාරවල දිග $a$ වූ ඝනකයකි. $P$ වූ කලී $BP = \lambda . PB'$ වන පරිදි $BB'$ දාරය මත පිහිටි ලක්ෂ්‍යයකි. $AD'$ රේඛාව සහ $P$ ලක්ෂ්‍යය අඩංගු තලය $B'C'$ දාරය $Q$ හිදී හමුවේ. $C'Q = \lambda . QB'$ බව පෙන්වන්න.

තව ද, $a$ සහ $\lambda$ ඇසුරෙන්

(අ) $PQ$ හි දිග, (ආ) $\cos A\hat{P}Q$, (ඉ) $APQD'$ හි වර්ගඵලය,
සොයන්න.

3. $ax + by + c = 0$ රේඛාව මත $(x_1, y_1)$ ලක්ෂ්‍යයේ ප්‍රතිබිම්බය සොයන්න.

$ABCD$ යනු $B \equiv (1, 0)$ සහ $AB$, $AC$ හි සමීකරණ පිළිවෙළින් $y - x + 1 = 0$ සහ $y - 3x = 0$ වන සේ වූ රොම්බසයකි. $DA$, $CD$ සහ $BC$ රේඛාවල සමීකරණ සොයන්න.

තව ද, $ABCD$ රොම්බසයේ වර්ගඵලය ද සොයන්න.

4. $x^2 + y^2 + 2gx + 2fy + c = 0$ වෘත්තය මත පිහිටි $Q_1$, $Q_2$ ලක්ෂ්‍ය හරහා වූ ස්පර්ශක $P_0 \equiv (x_0, y_0)$ හිදී හමුවේ. $P_0$ ලක්ෂ්‍යයෙහි $Q_1Q_2$ ස්පර්ශ ජ්‍යායෙහි සමීකරණය

$$x x_0 + y y_0 + g(x + x_0) + f(y + y_0) + c = 0$$

බව පෙන්වන්න.

$$x^2 + y^2 + 6y + 5 = 0 \text{ සහ } x^2 + y^2 + 2x + 8y + 5 = 0$$

වෘත්තවලට අනුබද්ධව $(1, -2)$ ලක්ෂ්‍යයේ ස්පර්ශ ජ්‍යායන් සම්පාත වන බව සාධනය කරන්න.

තව ද, ඉහත දක්වූ වෘත්තවලට අනුබද්ධව ස්පර්ශ ජ්‍යායන් එකම වන පරිදි වෙනත් ලක්ෂ්‍යයක් තිබෙන බව පෙන්වා එහි ඛණ්ඩාංක සොයන්න.

[ අනෙක් පිට බලන්න

5. (i) $O$ මූලයේ සිට දී ඇති ($O$ හරහා නොයන) $l$ සරල රේඛාවකට ඇඳි ලම්බය, ආරම්භක රේඛාව සමග $\alpha$ කෝණයක් සාදන අතර එහි දිග $d$ වේ. $l$ හි සමීකරණය $r = d \sec (\theta - \alpha)$ බව පෙන්වන්න. ඒ නයින්, $r \cos \theta = 3$ සහ $r \sin \theta = 4$ සමීකරණවලින් සරල රේඛා දෙකක් නිරූපනය කෙරෙන බව පෙන්වා

(අ) ඒවා අතර කෝණය ද,

(ආ) ඡේදන ලක්ෂයේ ධ්‍රැවක ඛණ්ඩාංක ද
සොයන්න.

(ii) එකම රූප සටහනෙහි,

(අ) $\frac{x^2}{4} + y^2 - 1 = 0,$

(ආ) $x^2 - 4y = 0,$

(ඇ) $y - x + 1 = 0$

වක්‍රවල කටුසටහන් අඳින්න.

$\frac{x^2}{4} + y^2 - 1 \leqslant 0, x^2 - 4y \geqslant 0$ සහ $y - x + 1 \geqslant 0$ අසමානතා සපුරාලන්නාවූ, $x - y$ තලයේ $R$ පෙදෙස සටහන් කරන්න. $R$ තුළ $x^2 + y^2$ හි වැඩිතම අගය ලබා ගන්න.

6. $y^2 = 4ax$ පරාවලයට $(at_1^2, 2at_1)$ සහ $(at_2^2, 2at_2)$ ලක්ෂවල දී ඇඳි ස්පර්ශකවල ඡේදන ලක්ෂය $\{ at_1t_2, a(t_1 + t_2) \}$ බව පෙන්වන්න.

$(at^2, 2at)$ ලක්ෂයෙහි ස්පර්ශකය $P \equiv (aT^2, 2aT)$ ලක්ෂය හරහා වූ ස්පර්ශකය සමග $\alpha$ කෝණයක් සාදයි නම්

$$t^2(1 - T^2 \tan^2 \alpha) - 2Tt \sec^2 \alpha + T^2 - \tan^2 \alpha = 0$$

සමීකරණයෙන් $t$ ගෙන දෙන බව පෙන්වන්න.

එවැනි ස්පර්ශක දෙකක් පවතින බව අපෝහනය කර, ඒවායේ $Q$ ඡේදන ලක්ෂයේ ඛණ්ඩාංක, $T$ සහ $\alpha$ ඇසුරෙන් සොයන්න.

$PQ$ හි සමීකරණය

$$y - 2aT = - \frac{2T}{1 - T^2} (x - aT^2)$$

බව ද පරාවලය මත $P$ චලනය වන විට එය අචල ලක්ෂයක් හරහා යන බව ද පෙන්වන්න.

7. $P \equiv \left\{ \frac{a(1 - t^2)}{1 + t^2} , \frac{2b\, t}{1 + t^2} \right\}$ ලක්ෂය $\frac{x^2}{a^2} + \frac{y^2}{b^2} = 1$ ඉලිප්සය මත පිහිටන බව පෙන්වන්න.

$P$ හි දී ඉලිප්සයට ඇඳි ස්පර්ශකයේ සමීකරණය

$$b(1 - t^2) x + 2aty = (1 + t^2)ab$$

බව ද පෙන්වන්න.

ඉලිප්සය මත වූ $Q$ ලක්ෂයේ ඛණ්ඩාංක

$\left\{ \frac{-2at}{1 + t^2} , \frac{b(1 - t^2)}{1 + t^2} \right\}$ වෙයි. $Q$ හි දී ස්පර්ශකයේ සමීකරණය ලියන්න.

තව ද, $t$ විචලනය වන විට, (අ) $OP^2 + OQ^2$ (ආ) $OPQ$ ත්‍රිකෝණයේ වර්ගඵලය නියතව පවතින බව ද පෙන්වන්න; මෙහි $O$ යනු මූල ලක්ෂය යි.

$P$ සහ $Q$ හිදී ඉලිප්සයට ඇඳි ස්පර්ශක එකිනෙකට $T$ හිදී හමුවේ. $t$ විචලනය වන විට, $T$ ලක්ෂය වෙනත් ඉලිප්සයක් මත පිහිටන බව ද පෙන්වන්න.

8. $x^2 - y^2 = a^2$ බහුවලයේ විකේන්ද්‍රිකතාව සොයා එහි, $S, S'$ නාභිවල ඛණ්ඩාංක ලියන්න. තව ද, $S$ සහ $S'$ ට අනුරූප නියාමකයන්ගේ සමීකරණ ද ලියන්න.

සුදුසු පරිදි ඛණ්ඩාංක අක්ෂ කුලකයක් තෝරා ගැනීමෙන් බහුවලයේ සමීකරණය $xy = \frac{a^2}{2}$ ලෙස ගත හැකි බව පෙන්වා නාභි දෙකෙහි ඛණ්ඩාංක ද අනුරූප නියාමකවල සමීකරණ ද ලියන්න.

සෘජුකෝණාස්‍ර බහුවලයක ස්පර්ශෝන්මුඛ දෙකට $S$ නාභියේ සිට ඇඳි ලම්බවල අඩි $L$ සහ $M$ වෙයි. $LM$ යනු $S$ ට අනුරූප වූ නියාමකය බව පෙන්වන්න.

$SL$ රේඛාව $N$ හි දී බහුවලය හමුවේ නම්, $N$ හිදී බහුවලයට ඇඳි ස්පර්ශකය $M$ හරහා යන බව පෙන්වන්න.

5. (i) $O$ ධ්‍රැවයේ සිට දී ඇති ($O$ හරහා නොයන) $l$ සරල රේඛාවකට ඇඳි ලම්බය, ආරම්භක රේඛාව සමග $\alpha$ කෝණයක් සාදන අතර එහි දිග $d$ වේ. $l$ හි සමීකරණය $r = d \sec(\theta - \alpha)$ බව පෙන්වන්න. ඒ නයින්, $r \cos\theta = 3$ සහ $r \sin\theta = 4$ සමීකරණවලින් සරල රේඛා දෙකක් නිරූපනය කෙරෙන බව පෙන්වා

(අ) ඒවා අතර කෝණය ද,

(ආ) ඡේදන ලක්ෂයේ ධ්‍රැවක ඛණ්ඩාංක ද සොයන්න.

(ii) එකම රූප සටහනෙහි,

(අ) $\frac{x^2}{4} + y^2 - 1 = 0,$

(ආ) $x^2 - 4y = 0,$

(ඇ) $y - x + 1 = 0$

වක්‍රවල කටුසටහන් අඳින්න.

$\frac{x^2}{4} + y^2 - 1 \leqslant 0$, $x^2 - 4y \geqslant 0$ සහ $y - x + 1 \geqslant 0$ අසමානතා සපුරාලන්නාවූ, $x$ - $y$ තලයේ $R$ පෙදෙස සටහන් කරන්න. $R$ තුළ $x^2 + y^2$ හි වැඩිතම අගය ලබා ගන්න.

6. $y^2 = 4ax$ පරාවලයට $(at_1^2, 2at_1)$ සහ $(at_2^2, 2at_2)$ ලක්ෂවල දී ඇඳි ස්පර්ශකවල ඡේදන ලක්ෂය $\{ at_1t_2, a(t_1 + t_2) \}$ බව පෙන්වන්න.

$(at^2, 2at)$ ලක්ෂයෙහි ස්පර්ශකය $P \equiv (aT^2, 2aT)$ ලක්ෂය හරහා වූ ස්පර්ශකය සමඟ $\alpha$ කෝණයක් සාදයි නම්

$$t^2(1 - T^2 \tan^2 \alpha) - 2Tt \sec^2 \alpha + T^2 - \tan^2 \alpha = 0$$

සමීකරණයෙන් $t$ ගෙන දෙන බව පෙන්වන්න.

එවැනි ස්පර්ශක දෙකක් පවතින බව අපෝහනය කර, ඒවායේ $Q$ ඡේදන ලක්ෂයේ ඛණ්ඩාංක, $T$ සහ $\alpha$ ඇසුරෙන් සොයන්න.

$PQ$ හි සමීකරණය

$$y - 2aT = -\frac{2T}{1 - T^2}(x - aT^2)$$

බව ද පරාවලය මත $P$ චලනය වන විට එය අචල ලක්ෂයක් හරහා යන බව ද පෙන්වන්න.

7. $P \equiv \left\{ \frac{a(1 - t^2)}{1 + t^2}, \frac{2b\,t}{1 + t^2} \right\}$ ලක්ෂය $\frac{x^2}{a^2} + \frac{y^2}{b^2} = 1$ ඉලිප්සය මත පිහිටන බව පෙන්වන්න.

$P$ හි දී ඉලිප්සයට ඇඳි ස්පර්ශකයේ සමීකරණය

$$b(1 - t^2)x + 2aty = (1 + t^2)ab$$

බව ද පෙන්වන්න.

ඉලිප්සය මත වූ $Q$ ලක්ෂයේ ඛණ්ඩාංක

$\left\{ \frac{-2at}{1 + t^2}, \frac{b(1 - t^2)}{1 + t^2} \right\}$ වෙයි. $Q$ හි දී ස්පර්ශකයේ සමීකරණය ලියන්න.

තව ද, $t$ විචලනය වන විට, (අ) $OP^2 + OQ^2$ (ආ) $OPQ$ ත්‍රිකෝණයේ වර්ගඵලය නියතව පවතින බව ද පෙන්වන්න; මෙහි $O$ යනු මූල ලක්ෂය යි.

$P$ සහ $Q$ හිදී ඉලිප්සයට ඇඳි ස්පර්ශක එකිනෙකට $T$ හිදී හමුවේ. $t$ විචලනය වන විට, $T$ ලක්ෂය වෙනත් ඉලිප්සයක් මත පිහිටන බව ද පෙන්වන්න.

8. $x^2 - y^2 = a^2$ බහුවලයේ විකේන්ද්‍රිකතාව සොයා එහි, $S$, $S'$ නාභිවල ඛණ්ඩාංක ලියන්න. තව ද, $S$ සහ $S'$ ට අනුරූප නියාමකයන්ගේ සමීකරණ ද ලියන්න.

සුදුසු පරිදි ඛණ්ඩාංක අක්ෂ තුලකයක් තෝරා ගැනීමෙන් බහුවලයේ සමීකරණය $xy = \frac{a^2}{2}$ ලෙස ගත හැකි බව පෙන්වා නාභි දෙකෙහි ඛණ්ඩාංක ද අනුරූප නියාමකවල සමීකරණ ද ලියන්න.

සෘජුකෝණස්‍ර බහුවලයක ස්පර්ශෝන්මුඛ දෙකට $S$ නාභියේ සිට ඇඳි ලම්බවල අඩි $L$ සහ $M$ වෙයි. $LM$ යනු $S$ ට අනුරූප වූ නියාමකය බව පෙන්වන්න.

$SL$ රේඛාව $N$ හි දී බහුවලය හමුවේ නම්, $N$ හිදී බහුවලයට ඇඳි ස්පර්ශකය $M$ හරහා යන බව පෙන්වන්න.